www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සභාග ආන්ඩුව පිහිටුවීමෙන් පසුවත් පකිස්ථානයේ දේශපාලන අස්ථාවරත්වය දිගටම

## Instability continues in Pakistan following formation of coalition government

**කීත් ජෝන්ස් විසිනි**
**2008 මාර්තු 12**

සති ගනනාවක කල්ලි වාදී උපාමාරුවලින් පසුව, පකිස්ථාන මහජන පක්ෂය (පීපීපී) සහ පකිස්ථාන මුස්ලිම් ලීගය-නවාස් (පීඑම්එල්-එන්) ජාතික සභාග ආන්ඩුවක් පිහිටුවීමේ එකඟතාවයක් නිවේදනය කලේ ය.

රටේ ජනාධිපති සහ දෙසැම්බර් මැද වන තුරු පකිස්ථානු සන්නද්ධ සේවාවල ප්‍රධානියා වූ පර්වේස් මුෂාරෆ් 1999 ඔක්තෝබර් මාසයේ දී කුමන්ත්‍රනයකින් බලය අල්ලා ගැනීමෙන් පසු කවර හෝ බලය බෙදාගැනීමකින් පකිස්ථානයේ ප්‍රධාන පක්ෂ ඉවත් කර තිබුනි. නමුත් පසුගිය මාසයේ මහ මැතිවරනයේ ප්‍රතිඵලයක් ලෙස දැන් පකිස්ථාන මහජන පක්ෂය හා පකිස්ථාන මුස්ලිම් ලීගය-නවාස් ජාතික මන්ත්‍රන සභාවේ සහ රටේ ප්‍රධාන පලාත් දෙකක - පන්ජාබ් සහ සින්ද් - පාර්ලිමේන්තුවල බලය ලබා ගෙන තිබේ.

පීපීපී සහ පීඑම්එල්-එන් ගිවිසුමේ ප්‍රධාන තැනක් හිමිවන්නේ දින තිහක් ඇතුලත ජාතික මන්ත්‍රනසභාව කැඳවා යුද නීතිය යටතේ නොවැම්බර් මාසයේ මුෂාරෆ් විසින් නෙරපනු ලැබූ රටේ උපරිමාධිකරනයේ සහ ශ්‍රේෂ්ඨාධිකරනයේ විනිශ්චයකාරවරුන් 60 දෙනා යලි සේවයේ පිහිටුවීමේ යෝජනාවක් සම්මත කිරීමටය.

නෙරපනු ලැබූ විනිශ්චයකාරවරුන් යලි සේවයේ පිහිටුවීමේ උත්සාහයක් නීති විරෝධී බව මුෂාරෆ් විසින් යලියලිත් ප්‍රකාශ කර ඇති අතර නෙරපනු ලැබූ උපරිමාධිකරන විනිශ්චයකාර ඉෆ්ටිකාර් චෞද්රි "වැදගැම්මකට නැති මිනිහෙක්" ලෙස හෙලා දැක තිබේ.

පකිස්ථාන මිලිටරිය සහ ඔත්තු සේවාවන් විසින් නිර්මානය කල මුෂාරෆ් හිතවාදී පකිස්ථාන මුස්ලිම් ලීගය (කිව්) (පීඑම්එල්-කිව්) පසුගිය මාසයේ මැතිවරනයේ දී ලැබූ අන්ත පරාජය බුෂ් පරිපාලනය විමතියට පත් කලේ ය. පසුගිය වසර හත තුල එය " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ දී" මුෂාරෆ් "අත්‍යවශ්‍ය සගයෙක්" ලෙස තැරුව් කර ඇත. පකිස්ථානයේ මිලිටරිය ආධිපත්‍යය දරන පාලන තන්ත්‍රයට එක්සත් ජනපදය දැවැන්ත දේශපාලන, මිලිටරි, සහ ආර්ථික ආධාර සපයා තිබේ.

දිගු විරාමයකට පසුව පීපීපී සහ පීඑම්එල්-එන් විසින් දේශපාලන හවුලක් පිලිබඳව කල පශ්චාත් මැතිවරන ආරම්භක ප්‍රකාශය සහ ඉරිදා පීපීපී සහ පීඑම්එල්-එන් ඇති කර ගත් එකඟතාවයට පාදක වූ ප්‍රධාන සාධකය නම් වොෂින්ටනයෙන් යෙදූ බලපෑම ය. 1999 දී ඔහුව අගමැති තනතුරින් නෙරපීම හේතු කොට ගෙන මුෂාරෆ් සමග අමනාපයෙන් සිටින නිසා පීඑම්එල්-එන් සහ එහි නායක නවාස් ෂරීෆ් ගැන බුෂ් පාලන තන්ත්‍රය අවිශ්වාස සහගතය. පෙබරවාරි 18 මැතිවරන යෙන් සති තුනකට පසුව, බුෂ් පරිපාලනයේ නිලධාරින් විසින් පීපීපී නායකත්වය දෙන ජාතික සභාග ආන්ඩුවකට මුෂාරෆ් හිතවාදී පක්ෂයේ ඉතුරුපහදු එකතු කර ගන්නා ලෙස දැඩිව ඉල්ලා සිටි අතර " ජාතික සමථකරනයේ" නාමයෙන් මුෂාරෆ් සමග වැඩ කරන ලෙස පීපීපී සහ පීඑම්එල්-එන් පක්ෂ දෙකට ම බල කලේ ය.

මෙම උත්සාහයන් අතහැර නැත. පකිස්ථානයේ එක්සත් ජනපද තානාපති ඈන් පැටර්සන් මැතිවරනයෙන් පසුව තෙවන වතාවට පීපීපී සභාපති අසිෆ් අලි සර්දාරි සඳුදා මුනගැසුනේ ය. සර්දාරි ඝාතනය කෙරුන පීපීපී නායිකාවගේ සහ හිටපු අගමැති බෙනාසීර් භූතෝගේ සැමියා ය.

සෙනෙට් සභාවේ විදේශ සම්බන්ධතා කමිටුවේ ප්‍රධානියා, ජෝ බිඩන් සහ එක්සත් ජනපද ඩිමොක්‍රටික් පක්ෂයේ සෙසු ප්‍රධාන නායකයෝ "අතීතය මත රැඳී නොසිටින" ලෙස පකිස්ථානයේ ප්‍රධාන සම්ප්‍රදායික පක්ෂවලින් ඉල්ලා සිටියහ; එනම් පකිස්ථානය ආන්ඩු කිරීමේ දී ආඥාදායක මුෂාරෆ්ට දිගටම ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීමට ඔවුන් ඉඩ දිය යුතුය.

මුෂාරෆ් සහ මිලිටරිය විසින් ඇති කල ව්‍යවස්ථාමය වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස, පකිස්ථාන සන්නද්ධ සේවාවන්ගේ ප්‍රධානින් පත් කරනු ලබන ජනාධිපතිට අගමැති බලයෙන් පහ කිරීමට සහ ජාතික මන්ත්‍රන සභාව විසුරුවා හැරීමටත්, රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධව පුලුල් බලතල සහිත මිලිටරිය විසින් ආධිපත්‍යය දරන ජාතික ආරක්ෂක කවුන්සිලයක ප්‍රධානත්වය දැරීමටත් බලය තිබේ. පසු ගිය බ්‍රහස්පතින්දා, එක්සත් ජනපද ඒකාබද්ධ හමුදා නායක

මංඩලයේ සභාපති මයිකල් මුලන් පිලිගැනීමෙන් පසු පකිස්ථානයේ මුෂාරෆ්ගේ අනුප්‍රාප්තික හමුදා ප්‍රධානියා වූ ජෙනරාල් අෂ්ෆක් බයානි "හමුදාව ජනාධිපතිගෙන් දුරස්ථවී ඇතැයි" යන ප්‍රකාශය හෙලා දකිමින් හමුදා කොමාන්ඩෝවරුන්ට කථාවක් පැවැත්වී ය.

පුවත්පත් සඳහා සංස්කරනය කල බයානිගේ කථාවේ දී මිලිටරිය "ඡන්දයෙන් තේරී පත්වූ ආන්ඩුවට සහායදීමේ දී එහි ව්‍යවස්ථාමය කාර්යභාරයක් ඉටු කිරීමට (කරමින්) කැපවී සිටින බව ප්‍රකාශ කල අතර දේශපාලන කාර්යභාරයක් ඉටුකිරීමේ ආශාවක් නැති බව ප්‍රකාශ කලේ ය. එහෙත් ජනාධිපතිගේ අධිකාරයට මිලිටරිය යටත් කර තබන "ජාතික අනදෙන ව්‍යුහයට" මිලිටරියේ කැපවීම ද අවධාරනය කල අතර පවතින තත්වය යටතේ කවර මට්ටමකින් හෝ "කිසිදු ආකාරයක භේද බින්නවීම්" ජාතියේ ලොකුම බලාපොරොත්තුව නොවන බව පැවසී ය.

අධිකරනය සුද්ධකිරීමේ ඔහුගේ අරමුන වුයේ පසුගිය ඔක්තෝබර් මාසයේ පැවති වංචාකාරී ජනාධිපතිවරනයේ ප්‍රතිඵල අනුමත කරන නම්‍යශීලී විනිශ්චයකරුවන් පත් කිරීම නිසා, තනතුරින් පහ කල විනිශ්චයකාරවරුන් නැවත සේවයේ පිහිටුවීමට නියෝග කරන ජාතික මන්ත්‍රන සභා යෝජනාවක් මුෂාරෆ්ගේ ජනාධිපති තනතුරේ සුජාතභාවයට සහ නීත්‍යානුකූලභාවයට ඍජු අභියෝගයක් වනු ඇත. විනිශ්චයකරුවන් නැවත සේවයේ පිහිටුවීම මුෂාරෆ්ගේ "යලි තේරීපත්වීමට" බොහෝ ව්‍යවස්ථාමය අභියෝගයන් නැවත මතු කෙරෙනු ඇත. එය ඔහු මත් "ව්‍යවස්ථාවෙන් පරිබාහිර ක්‍රියාවක් ලෙස පිලිගත්" පසුගිය නොවැම්බර් මාසයේ මුෂාරෆ්ගේ "ව්‍යවස්ථාව අත්හිටුවීමේ" ක්‍රියාව රාජ්‍ය ද්‍රෝහී නොවේ නම් නීති විරෝධී ක්‍රියාවක් ලෙස තර්ක කිරීමට ද මාවත පාදනු ඇත.

හුදු රාජ්‍ය මන්ත්‍රන සභා යෝජනාවකින්, නෙරපන ලද විනිශ්චයකරුවන් යලි සේවයේ පිහිටුවිය නොහැකි යයි මුෂාරෆ්ගේ සහ ඔහුගේ සගයන් ප්‍රකාශකර ඇති නිසා එවන් යෝජනාවක් සම්මත කිරීම ව්‍යවස්ථාමය අර්බුදයක් නිර්මානය කිරීමට බෙහෙවින් ම ඉඩ තිබේ. ඔහුගේ හමුදා පාලන තන්ත්‍රය යටතේ ගත් සියලුම පියවර අනුමත කිරීම සඳහා සති හයේ " හදිසි තත්වය" අහෝසිවීමට පෙර මුෂාරෆ් ඒකපාර්ශවීයව ව්‍යවස්ථාව යලි කෙටුම්පත් කලේ ය.

විනිශ්චයකාරවරුන් නැවත සේවයේ පිහිටුවීම හෝ මුෂාරෆ් සහ ඔහුගේ පාක්ෂිකයන් ප්‍රකාශ කරන ආකාරයට එසේ කලහැකි වන්නේ ව්‍යවස්ථාවේ සංශෝධනයක් ගෙන ඒම මගින් පමනි. ව්‍යවස්ථා සංශෝධනයකට ජාතික මන්ත්‍රන සභාවේ සහ සෙනෙට් සභාවේ තුනෙන් දෙකක සහයෝගය ලබා ගත යුතු ය. පීපීපී - පීඑම්එල් - එන් සහ ඔවුන්ගේ සුලුතර පක්ෂ සගයන්ට ජාතික මන්ත්‍රන සභාව තුල තුනෙන් දෙකකට ආසන්න බහුතරයක් ඇති නමුත් සෙනෙට් සභාව තුල බහුතර බලය තිබෙන්නේ මුෂාරෆ්ගේ දේශපාලන සගයන්ට ය. එමෙන්ම තනතුරුවලින් නෙරපන ලද විනිශ්චයකරුවන් යලි සේවයේ පිහිටුවීම පිලිබඳ ජාතික මන්ත්‍රන සභා යෝජනාවේ නීත්‍යානුකූල භාවය ගැන තීන්දුව දෙන්නේ මුෂාරෆ් විසින් පත්කරන ලද විනිශ්චයකරුවන් විසිනි.

ඊලඟ සඳුදා, එනම් මාර්තු 17 නව ජාතික මන්ත්‍රන සභාව ප්‍රථමවතාවට රැස්කරන බව පසුගිය අඟහරුවාදා නිවේදනය කලේ ය. නමුත් ජනාධිපති ලෙස ඔහුගේ පලමු ප්‍රමුඛතාවය "දේශපාලන ස්ථාවරත්වය" තහවුරු කිරීම බව කියමින් මුෂාරෆ් ඊට පෙර දින ඔහුගේ විරුද්ධවාදීන්ට අනතුරු ඇඟවීමක් කලේ ය.

විශ්‍රාමික හමුදා නිලධාරින්ගේ සැලකිය යුතු සංඛ්‍යාවක් ඇතුලුව, පකිස්ථාන ප්‍රභූවේ බොහෝ දෙනෙකු ඉල්ලා අස් වන ලෙස මුෂාරෆ්ට කියන නමුත් මිලිටරියේ සහ වොෂින්ටනයේ සහයෝගය දිගට ම ලැබෙන නිසාත් පීඑම්එල්-එන් සහ පීපීපී අතර දිගු කාලීන සතුරුකම නිසාත් දිගටම බලයේ සිටීමට හැකිවනු ඇතැයි ඔහු ගනන් බලයි.

ඔවුන්ගේ සභාග ගිවිසුම නිවේදනය කල ඉරිදා පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී සර්දාරී සහ ෂරීෆ් එකිනෙකා සමග මිත්‍රශීලී ස්වභාවයක් පෙන්නුම් කල බව ජනමාධ්‍ය වාර්තා කලේ ය. නමුත් මුෂාරෆ් සම්බන්ධ ආස්ථානයන්හි දී පක්ෂ දෙක අතර මතභේදයන් පවතින බව ක්ෂනිකව ම ඉස්මතු විය. මුෂාරෆ්ට ඉල්ලා අස්වන ලෙස දිගු කලකසිට ෂරීෆ් ඉල්ලා සිටින නමුත් බූතෝ ඝාතනය ගැන ඔහු වටේ සිටින්නවුන්ට ප්‍රසිද්ධියේ චෝදනා එල්ල වී ඇති හමුදා ආඥාදායකයා සමග වැඩ කිරීම පීපීපී ය විසින් කවරදාකවත් පැහැදිලිව ප්‍රතික්ෂේප කර නැත.

පීපීපී- පීඑම්එල්-එන් ගිවිසුම විනිශ්චයකාරවරුන් යලි සේවයේ පිහිටුවාලීමට පොරොන්දු වන නමුත්, මුෂාරෆ්ගේ ඉරනම ගැන එය නිහඬ බව මාධ්‍යවේදීන් පෙන්වා දුන් විට මුෂාරෆ්ගේ ජනාධිපතිකම ව්‍යවස්ථා විරෝධී සහ නීති විරෝධී" යැයි ඔහුගේ පක්ෂය කල්පනා කරන බව සර්දාරි පැවසී ය. "කිසිදු ප්‍රශ්නයක් ගැන අප එකිනෙකා අපහසුතාවට පත්කර ගන්නේ නැතැයි" ඔහු තව දුරටත් සඳහන් කලේ ය.

ජනාධිපතිගේ තේරී පත්වීම වංචාකාරී සහ යුද නීතිය ක්‍රියාවට යෙදවීම මගින් "ආරක්ෂා කෙරෙන" බව නොතකා ඔහු සමග සහයෝගයෙන් කටයුතු කිරීම බැහැර කිරීම ඔහුගේ පාර්ශවයෙන් සර්දාරි නැවත වතාවක් ප්‍රතික්ෂේප කලේ ය. මුෂාරෆ් සම්බන්ධ ප්‍රශ්නය ගැන සර්දාරි මෙසේ පැවසීය. "අප පුද්ගලික න්‍යායපත්‍ර විශ්වාස කරන්නේ නැහැ ... හැම කෙනෙක්ම

සහයෝගයෙන් කටයුතු කරනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

එමෙන්ම විනිශ්චයකාරවරුන්ගේ ප්‍රශ්නය සම්බන්ධ පීපීපී නායකයා ප්‍රකාශ කලේ ඔහුගේ ජනාධිපතිකම නීති විරෝධී බව ප්‍රකාශ කිරීමට ඉඩ තිබෙන අධිකරනයත් සමග සමථයක් ඇති කර ගැනීමට මුෂාරෆ්ට පිලිවන් වන්නේ කෙසේ දැයි විස්තර කිරීමකින් තොරව හැම කෙනෙක් ම සහයෝගයෙන් කටයුතු කරනු ඇතැයි යනුවෙනි.

පකිස්ථානයේ මිලිටරි-ඔත්තු සේවා සංස්ථාපිතය සමග පීපීපීයට වඩා පීඑම්එල්-එන් පක්ෂයට සමීප සම්බන්ධතාවයක් ඓතිහාසිකව, තිබී ඇත. කර්මාන්ත හිමියන්ගේ පවුලක බාලයා වූ ෂරීෆ් සිය දේශපාලන වෘත්තිය ආරම්භ කලේ එක්සත් ජනපද පිටුබලය ලත් ජෙනරාල් සියා උල්හක්ගේ රැකවරනය ලබන්නෙකු ලෙස ය. 1990 ගනන්වල දී ෂරීෆ් සහ ඔහුගේ පීඑම්එල්-එන් පක්ෂය පකිස්ථාන මහජන පක්ෂ ආන්ඩුව බලයෙන් පහකිරීම සඳහා මිලිටරිය සහ ආන්ඩු නිලධරය සමග නොනවත්වා වැඩ කලේ ය.

එහෙත්, මුෂාරෆ් විරෝධී බව පෙන්නුම් කිරීම මගින් පීඑම්එල්-එන් දේශපාලන ගැම්ම ලබාගෙන ඇත. ෂරීෆ් මෙම භූමිකාව තෝරාගෙන නොතිබූ නමුත් 1990 කුමන්ත්‍රනය සහ ඉක්බිතිව පීපීපීය සමග බලය බෙදාගැනීමක් මගින් මුෂාරෆ් තන්ත්‍රයට මුක්කු ගැසීමේ බුෂ් පරිපාලනයේ උත්සාහයන් විසින් ඔහුට ඒ සඳහා බල කෙරුනි.

මැතිවරනයේ දී පීඑම්එල්-එන් පක්ෂයේ අනපේක්ෂිත ශක්තියක් පෙන්නුම් කෙරුනේ මුෂාරෆ් කෙරෙහි එහි කර්කශ විරුද්ධත්වය සහ ආඥාදායකයා බලයේ තබා ගැනීමේ වොෂින්ටනයේ භූමිකාව ගැන පීපීපීයට වඩා ෂරීෆ් විවේචනාත්මක වූ නිසා ය.

පීපීපී ය නායකත්වය දෙනු ලබන සභාගයකට "පිටතින්" සහය දෙන බව කියමින් පීපීපීය නායකත්වය දෙන ජාතික සභාග ආන්ඩුවකට සම්බන්ධවීමට එය සති ගනනාවක් අදිමදි කලේය. ප්‍රසිද්ධියේ එය යුක්තිසහගත කලේ ජනාධිපතිට පක්ෂපාතීව දිව්රුම්දීම මගින් ඇමති තනතුරු ලබාගැනීමට සූදානම් නැතැයි යන පදනම මතය. ඇත්ත හේතු වූයේ දෙවන මැතිවරනයක් අපේක්ෂා කරමින් මහජන සහයෝගය ලබා ගැනීම සඳහා පීපීපීය සමග පොරයකට කැසකවමින් සිටීම ය.

මේ අතර සේවයෙන් නෙරපන ලද විනිශ්චයකරුවන් යලි සේවයේ පිහිටුවන ලෙස ඉල්ලමින් අඛන්ඩව වර්ධනය වන නීතිඥවරුන්ගේ විරෝධතා උද්ඝෝෂන නිසා මුෂාරෆ්ට එරෙහිව ක්‍රියා කිරීමේ මහජන පීඩනයට සර්දාරි සහ පීපීපී නායකත්වය ගොදුරුව සිටිති.

අවසානයේ දී විනිශ්චයකරුවන් යලි සේවයේ පිහිටුවීමේ ජාතික මන්ත්‍රන සභා යෝජනාවක් සම්මත කිරීමට හිලව් වසයෙන් පීපීපීය නායකත්වය දෙන සභාගයකට එකතුවීමට පීඑම්එල්-එන් පක්ෂය එකඟ විය.

රටේ ගැඹුරුවන ආර්ථික අර්බුදය සම්බන්ධයෙන් පක්ෂ දෙකෙන් එකක් වත් එතරම් හරයක් ඇති කිසිවක් කියා නැත. පෙර නුවූ විරූ වර්ධනයක කාල පරිච්ඡේදයක් තුල මුල්තැන් ගත් බව ගැන මුෂාරෆ් කයිවාරු ගසා ඇතත් ආහාර සහ බලශක්ති මිල ඉහල යාම, විදුලිබල කප්පාදුව සහ තිරිඟුපිටි හිඟකමෙන් පකිස්ථානය සහ මහජනතාව මෑත මාසවල දී බැට කෑවේ ය.

එලඹෙන ආන්ඩුව, රාජ්‍ය වියදම් කැපීම ඇතුලු දැඩි පියවර ගතයුතු බවට ප්‍රභූ කවයන් තුල අඩු හෝ වැඩි වශයෙන් පොදු පිලිගැනීමක් තිබේ. පෙබරවාරි 29 අන්තර්කාලීන ආන්ඩුව විදුලි ගාස්තු සියයට 9, ඉන්ධන ලීටරය රුපියල් 5, සහ බූමිතෙල් ලීටරය රුපියල් 3.50 ඉහල දැම්මේ ය.

පීපීපීය දුප්පතුන්ගේ පක්ෂය ලෙස මවාපාන නමුදු පීඑම්එල්-එන් සහ බලයෙන් ඉවත්ව යන මුෂාරෆ්ගේ ආන්ඩුවට නොඅඩු ලෙස පුද්ගලීකරනයේ, පාලන නීති ඉවත් කිරීමේ සහ වෙලඳපොලකරනයේ ආයෝජකයන්ගේ පිලිවෙත්වලට කැපව සිටින්නේ ය.

ආන්ඩුවට පීඑම්එල්-එන් සම්බන්ධ කර ගැනීම මගින් ඉදිරියේ දී ක්‍රියාවට දැමෙන පටි තද කිරීමේ ආර්ථික පිලිවෙත් කෙරෙහි මහජන කෝපය බෙදා ගැනීම පීපීපී ය සහතික කර ගනියි.

පීපීපීය සහ පීඑම්එල්-එන් කිසි ම ආකාරයකින් පකිස්ථාන මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් නියෝජනය නොකරති. ඔවුන් කතා කරනු ලබන්නේ, මිලිටරිය විසින් පාලිත වර්ධනය වන සමාගම් ජාලයක් හරහා වොෂින්ටනයේ සහයෝගය ඇතිව දේශපාලන බලයේ සහ ධනවාදී ලාභයේ ඒකාධිකාරය දරා සිටින මිලිටරිය කෙරෙහි අතෘප්තිය පෙන්නුම්කරන ඉඩම්හිමි ධනපති ප්‍රභූවේ කොටසක් වෙනුවෙන් ය.

ඇෆ්ගනිස්ථානයේ වාඩි ලා ගැනීමට අවශ්‍ය සැපයුම් සඳහා එක්සත් ජනපදය පකිස්ථානය මත යැපීම මුෂාරෆ්ට යහමින් ගසා කෑමට හැකි වෙතැයි විශ්වාස කරන කොටස් ද, විශේෂයෙන් ම පීඑම්එල්-එන් කඳවුර තුල සිටිති. මෙම කොටස් ලෝක න්‍යෂ්ටික නියාමන තන්ත්‍රය තුල සුවිශේෂ තත්වයක් ලබා ගැනීමට ඉන්දියාවට සහාය දීම ඇතුලුව එක්සත් ජනපදය ඉන්දියාව සමග ගෝලීය "මූලෝපායාත්මක පංගුකාර කමක්" ගොඩනගමින් සිටීම ගැන කෝපය සහ සැක සංකා මතුරයි.

විනිශ්චයකරුවන් සේවයෙන් පහකිරීම මිලිටරි පාලනය චිරස්ථායීව පවත්වාගෙන යාමේ ආඥාදායක ක්‍රියාවක් වන නමුදු, සේවයෙන් නෙරපන ලද විනිශ්චයකාරවරු මත් මුෂාරෆ් වෙනුවෙන් දීර්ඝකාලයක් අත එසවූ සහ අතිශයින්ම අසමාන පකිස්ථාන සමාජ-ආර්ථික පර්යායට මුක්කු ගසන දේපල සම්බන්ධතාවල ආරක්ෂකයෝ ය.

පකිස්ථානය සහ එක්සත් ජනපද අධිරාජ්‍යවාදය අතර දශක ගනනාවක සන්ධානයට පීපීපීය හෝ පීඑම්එල්-එන් විරුද්ධ වී නැත. මිලිටරිය භේද කරන සහ ඔවුන් ආමන්ත්‍රනය කරන ප්‍රභූ කවවල වරප්‍රසාදවලට අභියෝග කරන සමාජ-ආර්ථික ඉල්ලීම් මතුවීමට ඉඩ සලසනු ඇතැයි යන බිය නිසා මුෂාරෆ්ට සහ මිලිටරිය ආධිපත්‍යය දරන ආන්ඩුවට එරෙහි කවර හෝ බරපතල අභියෝගයක් මතුවීම වැලැක්වීමට පක්ෂ දෙකම උත්සාහ දරා තිබේ.

මූලිකව, වොෂින්ටනය පීපීපී සහ පීඑම්එල්-එන් සමග වැඩ කිරීම වලක්වා නැත. නමුත්, මුෂාරෆ් යටතේ බුෂ් පරිපාලනයට ඉරානයට විරුද්ධව යුද සූදානම් කිරීම් සහ ඇමරිකානු රහස් ඔත්තු සේවයේ විදේශ වධකාගාර භූමියක් ලෙස පවත්වා ගැනීම ඇතුලුව මධ්‍යම ආසියාවේ සහ මැද පෙරදිග එක්සත් ජනපද මෙහෙයුම්වල ප්‍රධාන කඳවුරක් ලෙස පකිස්ථානය යොදා ගැනීමට හැකිව තිබේ. එමෙන්ම, දශක ගනනාවක් පුරා එක්සත් ජනපද භූ-දේශපාලන සහ මිලිටරි මූලෝපායේ කඩඇනයක් බවට පත්ව තිබෙන පකිස්ථාන මිලිටරිය අඩු වශයෙන් මේ දක්වා මුෂාරෆ්ගේ පිටුපසින් සිටින බව එක්සත් ජනපදය දන්නේ ය.

ඡන්දයෙන් තේරී පත්වූ පකිස්ථාන ආන්ඩුව සහ ජනාධිපති මුෂාරෆ් අතර ගැටුමක්, පකිස්ථාන රාජ්‍යය අස්ථාවර කරමින් ස්වාධීන දේශපාලන අරගලයක් සඳහා මහජනතාව එලඹීමේ පිවිසුම් දොරටුවක් වනු ඇතැයි වොෂින්ටනය බිය වෙයි.

මුෂාරෆ්ට එක්සත් ජනපද සහය ලබා දීම ඉවත්කර ගැනීමකට එරෙහිව එක්සත් ජනපද අධිරාජ්‍යවාදී මූලෝපායේ පදවි රහිත බලධාරියා වන හෙන්රි කිසිංජර් ඔහු ලියූ පුවත්පත් ලිපියක දී සඳුදා මෙසේ අනතුරු ඇඟවීය: "කැපීපෙනෙන ඇමරිකානු සහයෝගය නොදීමක් මගින් සිදු වනු ඇත්තේ පකිස්ථානය තුල අප මුහුනදෙන අන්තරාය උග්‍ර කිරීම පමනි - ඇමරිකාවට පක්ෂපාත කලාපයේ නායකයන් වෙත එමගින් නිකුත් කෙරෙන පනිවුඩය ගැන සඳහන් කල යුතු නැත."

© www.wsws.org